# කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ
# வலயக் கல்வி காரியாலம் - கொழும்பு
# Zonal Education Office - Colombo


**දෙවන වාර පරීක්ෂණය - 2024**
**இரண்டாம் தவணை பரீட்சை - 2024**
**Second Term Test - 2024**

| 6 ශ්‍රේණිය | ගණිතය- I , II | කාලය : පැය 02 |
|---|---|---|

නම : ........................................................................ විභාග අංකය : ......................................

**I කොටස**

- **1 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමි වේ.**

1. 

මෙම රටාවේ ඇති වෘත්ත ගණන කොපමණද?

2. පහත භාග >,<, = ලකුණු වලින් සුදුසු ලකුණක් යොදා සංසන්දනය කරන්න.


(i) $\frac{3}{5}$ $\quad$ $\frac{2}{5}$ $\qquad$ (ii) $\frac{1}{7}$ $\quad$ $\frac{1}{12}$

3. 10 හි සාධක සියල්ලම ලියා දක්වන්න.

4. 15ත් 25ත් අතර 3 හි ගුණාකාර සියල්ලම ලියන්න.

5. 785 □ යන සංඛ්‍යාව 5න් ඉතිරි නැතිව බෙදීමට □ යෙදිය හැකි ඉලක්කම් දෙක ලියන්න.

6. පහත රූප අතරින් සරල රේඛීය සංවෘත තල රූපය තෝරා යටින් ඉරක් අඳින්න.




(i) (ii) (iii) (iv)

7. හිස්තැන් පුරවන්න.

$\frac{1}{5}$ ඒවා 3 ක් _______ වේ.

8. 1.52 පහත සණක රාමුවේ දක්වන්න.




| 10 | 1 | $\frac{1}{10}$ | $\frac{1}{100}$ |
| --- | --- | --- | --- |

9. 0.54 භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න.

10. 0.5 .............. 0.48 හි හිස්තැනට සුදුසු < හෝ > ලකුණ යොදන්න.

11. නිමල් පාසල් ඇරී නිවසට පැමිණෙන විට වේලාව පස්වරු 3.40 වි තිබුණි. එම වේලාව අන්තර්ජාතික සම්මත ක්‍රමයට ලියා දක්වන්න.

12. රූපයේ දී ඇති කෝණ වර්ග දෙක ලියන්න.




a .....................................

b .....................................

13. හිස්තැන් වලට සුදුසු අගයන් යොදන්න.

(i) 1 cm = ............................ mm

(ii) 1000 m = ............................. km

14. ආරෝහණ පිලිවෙලට ලියන්න.

0.2 1.5 0.04 0.35

15. * මගේ ප්‍රතිවිරුද්ධ පැති යුගල අතර පරතරය නියතය.
* මගේ සියලුම පැතිවල දිග සමාන වේ.
* මම ඍජුකෝණ නොමැති තල රූපයකි.

මම කවුද? .........................................................

16. පහත සංඛ්‍යා ආසන්න 10 ගුණිතයට වටයන්න.

(1) 23 (2) 85


17. 0 ත් 10 ත් අතර ප්‍රථමක සංඛ්‍යා සියල්ලම ලියා දක්වන්න.

18. ‘එක් බිලියන හැට නව මිලියන තුන්සිය අසූ හතර’ යන සංඛ්‍යාව අන්තර්ජාතික සම්මත ක්‍රමයට ලියන්න.

19. $\frac{3}{5}$ සඳහා තුල්‍ය භාගයක් වන භාගය අඩංගු පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) $\frac{1}{2}$ (2) $\frac{3}{10}$ (3) $\frac{2}{5}$ (4) $\frac{6}{10}$

20. ඊළඟ රටාව අඳින්න.



**II කොටස**

*** පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුලු ප්‍රශ්න ගණන 5 කි.**

*** පළමු ප්‍රශ්නයට ලකුණු 16ක්ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින්ද පිරිනැමේ.**

*** පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**


**(පළමු ප්‍රශ්නය සඳහා පන්තිකාමරයේ දී ඔබේ ගුරුතුමා හෝ ගුරුතුමිය විසින් කරන ලද පාඩමෙහි නම ලිවිය යුතු අතර ක්‍රියාකාරකම සිහිපත් කර ගන්න.)**

(01)


(a) පහත දැක්වෙන කාඩ්පතෙහි සටහන් කර ඇති සංඛ්‍යා මෙම ගැටලුවට පිළිතුරු ලිවීමට යොදා ගන්න.

| | | | |
|---|---|---|---|
| 1 | 2 | 3 | 4 |
| 5 | 6 | 7 | 8 |
| 9 | 10 | 11 | 12 |
| 13 | 14 | 15 | 16 |

(i) ඉහත කාඩ්පතෙහි අඩංගු සංඛ්‍යා වලින් රූපයේ දක්වා ඇති මලෙහි මල් පෙති මත එම සංඛ්‍යා වර්ගයට සුදුසු සංඛ්‍යා 4 බැගින් ලියන්න. (2 x 5 = 10)




(ii) පහත සංඛ්‍යා රේඛාවේ -2 හා +1 ලක්ෂ ලකුණු කරන්න.




(iii) -3 හා +3 අතර ඇති ධන නිඛිල සියල්ලම ලියා දක්වන්න.

(iv) > = < ලකුණු වලින් සුදුසු ලකුණු හිස්තැනට යොදන්න.

a) -3 .................... -5 b) +1 .................... -1

(02) (a) (i) හරය 5 ට අඩු ධන නිඛිලයක් වන ඒකක භාග 2ක් ලියන්න. (ලකුණු 1)

(ii) හිස්තැනට ගැලපෙන අගයන් ලියන්න.

$$\frac{3}{5} = \frac{3 \times \ldots\ldots}{5 \times \ldots\ldots} = \frac{\ldots\ldots}{15}$$

(iii) සුලු කරන්න.


( a) $\frac{1}{7} + \frac{3}{7}$ (ලකුණු 2) (b) $\frac{5}{6} + \frac{1}{18}$ (ලකුණු 3)

(iv) පෙට්ටියක සර්ව සම රතු පාට බෝල 5 ක්ද නිල පාට බෝල 7 ක්ද ඇත.

(a) පෙට්ටියේ ඇති රතුපාට බෝල ප්‍රමාණය මුලු බෝල ප්‍රමාණයේ භාගයක් ලෙස ලියන්න. (ලකුණු 1)

(b) එයට හරය 36 ක් වූ තුල්‍ය භාගයක් ලියන්න.

(03) (a)




1 ...............................

2 ...............................

3 ...............................


4 ...............................

5 ...............................

6 ...............................


(6 x 1 = 6)

(b) (i) පහත රූපයේ පරිමිතිය සොයන්න. (ලකුණු 3)




(ii) ඔබට ලැබුණු පිළිතුර මිලිමීටර වලින් ලියන්න. (ලකුණු 2)

(04) (a) අමරපුර විද්‍යාලයේ 06 ශ්‍රේණියේ ඉගෙනුම ලබන දිලිත්ගේ සුරතලා ගෙදරින් අතුරුදහන් වී තිබුණි. එම සුරතලාගේ පයට පැගී තිබූ තින්ත ස්වල්පයක් නිසා ඌ ගිය මාර්ගය පහත පරිදි සටහන් වී තිබුණි.




(1) දිලිත්ගේ නිවසින් පිටත් වූ සුරතලා මුලින් ම ගමන් කර ඇති දිශාව කුමක්ද? (ලකුණු 1)

(2) B මංසන්දියෙන් ඌ කුමන දිශාවට හැරී තිබේද? (ලකුණු 1)

(3) D මංසන්දියේ සිට E දක්වා ගමන් කර ඇති දිශාව කුමක්ද? (ලකුණු 2)

(4) G මංසන්දියට පැමිණි පසු රූපයේ දක්වා ඇති දිශාවට නොගොස් D දක්වා යාමට නම් ඌ කුමන දිශාවට ගමන් කළ යුතුද? (ලකුණු 2)

(5) අවසානයේ සුරතලා සිටින්නේ දිලිත්ගේ නිවසට කුමන දිශාවෙන්ද? (ලකුණු 2)

(b) (i) 18 සාධක සෙවීම සඳහා පහත හිස්තැන් පුරවන්න.

18 ⟶ 1 x 18
2 x ......... (ලකුණු 1)
3 x ......... (ලකුණු 1)

18 හි සාධක → 1, ........, ........., ........., ........., 18 (ලකුණු 1)

(05) (a) පහත දැක්වෙන රූපයේ දක්නට ලැබෙන සරල රේඛීය තල රූප හඳුනාගෙන දී ඇති පරිදි එම එක් එක් තල රූපයට අදාළ අංකය එම තල රූපය තුළ ලියා දක්වන්න. (පළමු උදාහරණය ඔබ වෙනුවෙන් සම්පූර්ණ කර ඇත)

(1) සමචතුරස්‍රය


(2) ත්‍රපීසියම

(3) සමාන්තරාස්‍රය

(4) ත්‍රිකෝණය

(5) රොම්බසය

(6) සෘජුකෝණාස්‍රය (1 x 5)




(b) අගය සොයන්න.

(i) 0.3
+ 0.5
(ලකුණු 1)

(ii) 2.04
+ 0.97
(ලකුණු 2)

(iii) 2.8
- 1.5
(ලකුණු 1)

(iv) 13.5 – 8.03
(ලකුණු 2)

(06) (a) එක්තරා ගොවිපලක සිටින රත්ති, හඳයා, සුද්දී, පුංචී සහ ලීනා ලෙස නම් කරඇති එළදෙනන්ගෙන් දොවා ගන්නා ලද කිරි ප්‍රමාණයන් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| එළදෙනගේ නම | දොවා ගන්නා ලද කිරි ප්‍රමාණය |
|---|---|
| රත්ති | 700 ml |
| හඳයා | 1L 250 ml |
| සුද්දී | 420 ml |
| පුංචී | 2L 730 ml |
| ලීනා | 1L 950 ml |

(1) වැඩිම කිරි ප්‍රමාණයක් ලබා දී ඇති එළදෙනගේ නම කුමක්ද? (ලකුණු 1)

(2) හඳයා ලබා දී ඇති කිරි ප්‍රමාණය මිලිලීටර කීයද? (ලකුණු 1)

(3) පුංචී හා ලීනා ලබා දී ඇති කිරි ප්‍රමාණයන් අතර වෙනස කීයද? (ලකුණු 2)


(4) සතුන් සියලුම දෙනාගෙන් ලබා ගත් මුලු කිරි ප්‍රමාණය ලීටර වලින් ලියන්න. (ලකුණු 3)

(b) සුදුසු පරිදි යා කරන්න.

| | |
|---|---|
| පැය 1 | පැය 1 මිනිත්තු 30 |
| පැය 27 | දින 1 පැය 3 |
| තත්පර 100 | මිනිත්තු 60 |
| මිනිත්තු 90 | මිනිත්තු 1 තත්පර 40 |

(ලකුණු 4)

(07) (a) ඝනවස්තුවක් සාදා ගැනීමට සකස් කරන ලද පතරොමක් පහත දැක්වේ.



(1) ඉහත පතරොම මගින් සාදාගත හැකි ඝනවස්තුවේ නම ලියන්න. (ලකුණු 1)

(2) එහි මුහුණත් දාර ශීර්ෂ ගණන වෙන වෙනම ලියන්න. (ලකුණු 3)

(3) මෙවැනි ඝනවස්තු දෙකක් එකට ඇලවීමෙන් සාදාගත හැකි නව ඝනවස්තුවේ මුහුණත් ගණන කීයද? (ලකුණු 2)

(b) (i) පහත සඳහන් සංඛ්‍යා ආසන්න 10 ට වැටයූ විට ලැබෙන පිළිතුර තිත් ඉරි මත ලියන්න.

1) 34 ................... 2) 58 ...................

3) 65 ................... (1 x 3)

(ii) යම් සංඛ්‍යාවක් ආසන්න 10 ට වැටයූ විට 90 වේ. එම සංඛ්‍යාවට ගතහැකි කුඩාම අගය හා විශාලම අගය ලියන්න. (ලකුණු 2)


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න